**සීතාවක ප්‍රාදේශීය සභාවේ 2019 අප්‍රේල් මස 10 වන දින**
**පෙ.ව.10.00 ට ප්‍රාදේශීය සභාවේ සභා ශාලාවේදී පවත්වන ලද**
**මහා සභා රැස්වීමේ වාර්තාව.**

සහභාගී වූ : -

| | | | |
|---|---|---|---|
| 1. | ගරු සභාපති | - | ජී. ජයන්ත රෝහණ මැතිතුමා |
| 2. | ගරු උප සභාපති | - | එස්.ඩී.මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා |
| 3. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | චන්දන ප්‍රේමනාත් මුදුන්කොටුව මැතිතුමා |
| 4. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ.ඒ.විමල් ප්‍රසන්න මැතිතුමා |
| 5. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඒ.මේරි මාග්‍රට් මැතිතුමිය |
| 6. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ආර්. ගයාන් දුමින්ද චන්ද්‍රසිරි මැතිතුමා |
| 7. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ලියනගේ චන්දන කුමාර මැතිතුමා |
| 8. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ඒ.ඩී.එස්. ජයන්ත රණවක මැතිතුමා |
| 9. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ. මංජුල ධම්මික වීරරත්න මැතිතුමා |
| 10. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්.ඒ. ප්‍රේමරත්න මැතිතුමා |
| 11. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා |
| 12. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | බී. සනී හෙක්ටර් පිරිස් මැතිතුමා |
| 13. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී. කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා |
| 14. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එල්.නන්ද කුමාරසිංහ මැතිතුමා |
| 15. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ඒ. උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා |
| 16. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා |
| 17. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | පී.කේ. උපුල් ජිනේන්ද්‍ර කුලතිලක මැතිතුමා |
| 18. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | සුසන්ත සිසිර කුමාර රූපසිංහ මැතිතුමා |
| 19. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඒ.ඩී. ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය |
| 20. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය |
| 21. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඒ. සුසන්ත මැතිතුමා |
| 22. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා |
| 23. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්. වරුණ දිලිප් කුමාර මැතිතුමා |
| 24. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එච්.පී.උපුල් ප්‍රසන්න මැතිතුමා |
| 25. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්.ඩී. චින්තක දේවින්ද සමරවීර මැතිතුමා |
| 26. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | කේ. නිමල් යසසිරි කළුපහන මැතිතුමා |
| 27. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා |
| 28. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා |
| 29. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඩබ්. අසෝක වැලිකල මැතිතුමා |
| 30. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්. චන්ද්‍රකුමාර් මැතිතුමා |
| 31. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ජී. කුමුදිණී ජයවර්ධන මැතිතුමිය |
| 32. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ශෂිණී ශ්‍රීමාලි හෙට්ටිආරච්චි මැතිතුමිය |
| 33. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ර්.ජී.ඩී. ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසීලි මැතිතුමිය |
| 34. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එම්.ඩී. මාලනී චන්ද්‍රලතා මැතිතුමිය |
| 35. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ආර්.ඒ.ඩි.සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය |
| 36. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මැතිතුමා |
| 37. | ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී | - | එස්. චන්දන සූරියආරච්චි මැතිතුමා |

38. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එච්.එස්.සුනිල් රණසිංහ මැතිතුමා
39. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - එන්.පී.කේ. සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය
40. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පී.ඒ.ප්‍රදිප් කුමාර් මැතිතුමා

<u>සහභාගි නොවූ</u>

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - ආර්.පී. යසරු දෙවන්මිණ රාජපක්ෂ මැතිතුමා
2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - කේ.ඒ.ඩී. පිලිෂියා ඇනට් ඔල්ගා මැතිතුමිය
3. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී - පුස්සැල්ලගේ අමල් නිශාන්ත සිල්වා මැතිතුමා

<u>ගරු සභාපතිතුමා</u>

සුභ උදෑසනක් වේවා ගරු උප සභාපතිතුමනි, ගරු මන්ත්‍රීතුමනි, ගරු මන්ත්‍රීතුමියනි, සීතාවක ප්‍රාදේශීය සභාවේ **2019** අප්‍රේල් මාසයේ මහා සභා රැස්වීමට සහභාගි වීමට පැමිණි ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලා මන්ත්‍රීතුමියන්ලා සියළුදෙනාම ඉතාමත්ම ගෞරවයෙන් මේ අවස්ථාවේ පිළි ගන්නවා. ලේකම්තුමා ප්‍රධාන නිලධාරි මණ්ඩලය ඒවගේම කාර්යමණ්ඩලය සියළුදෙනාමත් ජනමාධ්‍යවේදි මහත්වරුන් සියළුදෙනාමත් ඉතාමත් ගෞරවයෙන් පිළිගන්නවා.

ඒ අනුව න්‍යායපත්‍රානුකූලව පළමුවෙන්ම තියෙන්නේ පහුගිය සභා රැස්වීම් වාර්තාව සභා සම්මත කර ගැනීම.
සංශෝධන හා වෙනසක්කම් ඇතොත් පෙන්වා දීලා එම වාර්තාව සභා සම්මත කරන්න ගරු මන්ත්‍රීතුමන්ලාට අවස්ථාව ලබලා දෙනවා.

## <u>01. පසුගිය රැස්වීමේ වාර්තාව සම්මත කර ගැනීම.</u>

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, **2019.03.11** වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව සත්‍ය වාර්තාවක් බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමිය</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

<u>**2019.03.11** වන දින පැවති මහා සභා රැස්වීමේ වාර්තාව පිළිගත යුතු සත්‍ය වාර්තාවක් බවට ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ. මේරි මාග්‍රට් මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>

## <u>02. සභාපතිවරයා විසින් කරනු ලබන විශේෂ නිවේදන.</u>

01. **2019.01.10** දින මහා සභා රැස්වීමේදී **05 - (23)** යෝජනාව යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා විසින් "වතු ආශ්‍රිතව වෙන් වූ සුසාන භූමි ඉදිකිරීම" සම්බන්ධයෙන් ඉදිරිපත් කරන ලද යෝජනාවට ගරු සභාපතිතුමා විසින් වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය වෙත යොමු කළ ලිපියට පිළිතුරු වශයෙන්, අධ්‍යක්ෂක, වැවිලි කර්මාන්ත අමාත්‍යාංශය විසින් මෙම ඉල්ලීම සම්බන්ධයෙන් විශේෂ අවධානය යොමු කර පුස්සැල්ලාව වතු සමාගමට අයත් වතු වල සුසාන භූමි ඉදිකිරීමට ඉඩම් කොටසක් වෙන් කර දීමට කටයුතු කරන ලෙස ඉල්ලමින් සභාපති, සීතාවක ප්‍රාදේශීය සභාව වෙතද පිටපතක් සහිතව ප්‍රධාන විධායක නිලධාරි, පුස්සැල්ලාව වතු සමාගම, ගාලු පාර, කොළඹ **03** වෙත **2019.03.06** දිනැතිව යොමු කළ ලිපිය.

02. 2019.01.10 දින මහා සභා රැස්වීමේදී සංදේශ පෙත්සම් යටතේ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා විසින් පාදුක්ක නගරය සඳහා ජාතික ඉතිරිකිරීමේ බැංකු ශාඛාවක් ලබා දෙන ලෙස කරන ලද ඉල්ලීමට ගරු සභාපතිතුමා විසින් ජාතික ඉතිරිකිරීමේ ප්‍රධාන බැංකු ශාඛාවට යොමු කරන ලද ලිපියට පිළිතුරු වශයෙන්, පාදුක්ක නගරයේ බැංකු ශාඛාවක් ආරම්භ කිරීමට ප්‍රධාන මාර්ගයට මුහුණලා ඇති පර්චස් 20 ට නොඅඩු රජයේ ඉඩම් කැබැල්ලක් තිබේ නම් දන්වා එවන ලෙස ඉල්ලමින් 2019.04.05 දිනැතිව ජාතික ඉතිරිකිරීමේ බැංකුව, කොළඹ 03, සහකාර සාමාන්‍යාධිකාරි (මෙහෙයුම්) විසින් ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

03. බස්නාහිර පළාත් මහජන නියෝජිතයන්ගේ සහ නිලධාරින්ගේ රාජකාරි හා පෞද්ගලික විදේශ ගමන් සඳහා වන ඇතැම් අයදුම්පත්‍ර නියමිත ධූරාවලිය ඔස්සේ නිවාඩු ලබා ගැනීමට දින 14 කට පෙර ගරු ආණ්ඩුකාරතුමා වෙත අනුමැතියට ඉදිරිපත් කිරීමට හැකිවන පරිදි නිවාඩු අයදුම්පත් මෙම අමාත්‍යාංශය වෙත ඉදිරිපත් කිරීම අනිවාර්යය බව අවධාරණය කරමින් ලේකම්, පළාත් පාලන අමාත්‍යාංශය විසින් 2019.03.05 දිනැතිව බස්නාහිර පළාතේ සියළුම ආයතන ප්‍රධානින් වෙත යොමු කරන ලද ලිපිය.

<u>03. ප්‍රාදේශීය සභාව අමතා එවන ලද සංදේශ, පෙත්සම්, පැමිණිලි හා සන්නිවේදන සභාවට ඉදිරිපත් කිරීම.</u>

<u>03 - (01) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.</u>

01. ˝පෞද්ගලික ඉඩමක බලහත්කාරයෙන් ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍රයක් උපයෝගි කරගෙන පස් ඉවත් කිරීම˝ යන හිසින් යුතුව වග, පින්නවල, බෝධිය අසල, නො. 112/3 හි පදිංචි ආර්.පී.කේ.පී රාජපක්ෂ මයා විසින් මේ සම්බන්ධයෙන් කාරුණික පිළිතුරක් ලබා දෙන ලෙස ඉල්ලමින් 2019.04.01 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

<u>03 - (02) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.</u>

01. ˝පෞද්ගලික ඉඩමක බලහත්කාරයෙන් ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍රයක් උපයෝගි කරගෙන පස් ඉවත් කිරීම˝ යන හිසින් යුතුව වග, පින්නවල, බෝධිය අසල, නො. 112/3 හි පදිංචි ආර්.පී.කේ.පී රාජපක්ෂ මයා විසින් මේ සම්බන්ධයෙන් කාරුණික පිළිතුරක් ලබා දෙන ලෙස ඉල්ලමින් 2019.04.01 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

<u>03 - (03) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මාලනී චන්ද්‍රලතා මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලදී.</u>

01. ˝පෞද්ගලික ඉඩමක බලහත්කාරයෙන් ප්‍රාදේශීය සභාවේ බැකෝ යන්ත්‍රයක් උපයෝගි කරගෙන පස් ඉවත් කිරීම˝ යන හිසින් යුතුව වග, පින්නවල, බෝධිය අසල, නො. 112/3 හි පදිංචි ආර්.පී.කේ.පී රාජපක්ෂ මයා විසින් මේ පිළිබඳව කාරුණික පිළිතුරක් ලබා දෙන ලෙස ඉල්ලමින් 2019.04.01 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

<u>03- (04) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමිය විසින් ඉදිරිපත් කරන ලදී.</u>

01. පහත්ගම පළවෙනි පටුමග ස්ථාන 05ක, හංවැල්ල නගරය අම්බලම් පාර ස්ථාන 03 ක හා හංවැල්ල ජයවීරගොඩ පාරෙහි වතුර ලබා දීම සඳහා කඩන ලද මාර්ගයන් හැකි ඉක්මණින් පිළිසකර කර දෙන ලෙස ඉල්ලමින් ගරු

ප්‍රාදේශීය සභා මන්ත්‍රී මේරි මාග්‍රට් මැතිතුමිය විසින් 2019.03.21 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

02. පහත්ගම සිට වනහගොඩ හන්දිය අතරේ ඇති පොදු මාවත (යෝගට් පාර) සඳහා එක් රැස්වන ජලය බැස යාමට අඩි 12 හෝ 15 ක පමණ හියුම් පයිප්ප යෙදූ කුඩා බෝක්කුවක් ඉදිකර දෙන ලෙස ඉල්ලමින් හංවැල්ල, අළුත් පාර, 218/ඒ, හි පදිංචි කේ. විජේදාස මයා විසින් 2019.04.01 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

<u>03 - (05) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.</u>

01. පාදුක්ක, මීපේ, දෙකදූවල පාර, නො. 171/2/22 හි පදිංචි අනුෂා ප්‍රියදර්ශනී මිය විසින් තම නිවසට වම් දෙසින් ඇති නිවසෙහි තාප්පය උඩ ඇති අනතුරුදායක ද්‍රව්‍ය ඉවත් කර ගැනීම සම්බන්ධයෙන් එම නිවැසියන් දැනුවත් කරන ලෙස ඉල්ලමින් 2019.04.03 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

<u>03 - (06) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වරුණ දිලිප් කුමාර මැතිතුමා විසින් ඉදිරිපත් කරන ලදී.</u>

01. පාදුක්ක උග්ගල්ල සිරිසුමන මාවතේ විදුලි පද්ධතියේ ඇති දෝෂ නිරාකරණය කරගැනීම සම්බන්ධයෙන් අවධානය යොමු කරන ලෙස ඉල්ලමින් පාදුක්ක, උග්ගල්ල, නො.223 හි පදිංචි ඒ.සී.කේ. අතුකෝරල මයා විසින් ප්‍රදේශවාසින්ගේ අත්සන් ලේඛනයක්ද සමගින් 2019.04.09 දිනැතිව ගරු සභාපතිතුමා අමතා යොමු කරන ලද ලිපිය.

<u>ගරු සභාපතිතුමා</u>

චන්දන සූරියආරච්චි මන්ත්‍රීතුමාත්, රණවක මන්ත්‍රීතුමාත් ඇතුළු තවත් මන්ත්‍රීවරුන් ඉදිරිපත් කල ලිපියත් එහි උසාවිමය තීරණයකුත් තියෙන සිද්ධියක් සම්බන්ධයෙන් තමයි මේ ලිපිය යොමු කරන්නේ. අපිට කොයි තරම් දුරට කටයුතු කරන්න පුළුවන්ද කියන කාරණයත් තියෙනවා. උසාවියෙන් දීපු තීන්දුවක් තියෙනවා. මම හිතන්නේ අදාල පළාතේ ඉන්න මන්ත්‍රීවරු මේ සම්බන්ධව දන්නවා. විශාල ප්‍රශ්නයක් ඇති වුණු ස්ථානයක්. පහුගිය කාලයේ වුණු සිද්ධිය. ඒ නිසා ඒ ගැන වෙනම හොයලා බලන්න වෙයි. අපිට එක පාරට ඍජු තීන්දුවක් ගන්න පුළුවන් තැනක නෙමෙයි ඒ පෙත්සම් ඉදිරිපත් කළත් අපිට තීන්දුවක් ගන්න පුළුවන් තැනක නොවෙන බවයි ප්‍රකාශ කරන්න තියෙන්නේ. අපි යොමු කරලා බලමු මොකද්ද වෙන්නේ කියලා.

<u>04.යථා පරිදි කල් දී ඇති ප්‍රශ්න - ඉදිරිපත්ව නැත.</u>

<u>05. යථා පරිදි කල් දී ඇති යෝජනා.</u>

<u>ගරු සභාපතිතුමා</u>

ඒ අනුව 05 – (01) යෝජනාව ඉදිරිපත් කිරිම සඳහා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මන්ත්‍රීතුමාට අවස්ථාව ලබලා දෙනවා.

<u>05 – (01) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා විසින් යෝජනා කරයි.</u>

සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ 429/සී ඇස්වත්ත ග්‍රාම සේවා වසමේ පිහිටි අවිස්සාවේල්ල කොළඹ මාර්ගයේ හිඟුරල සිට මිරිස්වත්ත යා කෙරෙන "දිගපත මාර්ගය" සීතාවක ප්‍රාදේශීය සභාවේ හිටපු මන්ත්‍රීවරයෙකු මෙන්ම

ප්‍රදේශයට විශාල සමාජ සේවාවක් කල "වසන්ත කුමාර රත්නසිරි" මහතා නමින් නම් කරන ලෙස මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වන්දන මුදුන්කොටුව මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් අදහස් දක්වන ලදී.

ගරු සභාපතිතුමා

මෙම යෝජනාව සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන්ගේ විරෝධතාවයක් නොමැති බැවින් මෙම යෝජනාව ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වන්දන මුදුන්කොටුව මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

05 – (02) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශීය සභාවට අයත් මාර්ග ලේඛනයේ අංක 796 දරණ, පාදුක්ක අංක 461 ග්‍රාම නිලධාරි වසමේ පාදුක්ක, හොරණ පාර, අතුරු මාර්ගය (ඩයස් ඉන්ධන පිරවුම්හල අසලින් ඇති) සඳහා හැඳින්වීමේ නාමයක් නොමැත. මාර්ගය පළලින් මීටර් 5 ක් ලෙසද දිග මීටර් 100 ක් ලෙසද එහි සඳහන් වේ. පාදුක්ක කේන්ද්‍ර කරගෙන නගරයක් නිර්මාණය කිරිමේ නියමුවෙකු ලෙස මෙම මාර්ගයේ පදිංචිකරුවෙකු වූ මිය පරලොව සැපත් සරත් ගුණසේකර මහතා අපිට හැඳින්විය හැකි හරවත් චරිතයකි.

එතුමා සුප්‍රකට වසර 62 ක ඉතිහාසයක් ඇති සරත් විද්‍යාලයේ නිර්මාතෘවරයා මෙන්ම පාදුක්ක මොරගහතැන්න ශ්‍රී මහා විහාරස්ථ දායක සභාවේ ගරු ලේකම්වරයා ලෙස දශක හතරකට ආසන්න කාලයක් කටයුතු කළ අතර ප්‍රදේශයේ සමාජ සංවිධාන ගණනාවකටද නායකත්වය දුන් අයෙකි. උක්ත මාර්ගය "සරත් ගුණසේකර මාවත" ලෙස නම් කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

මෙම යෝජනාව සම්බන්ධයෙන් පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් විසින් අදහස් දක්වන ලදී.

1. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා.

2. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුමුදිනී ජයවර්ධන මැතිතුමිය.

ගරු සභාපතිතුමා

මේ සම්බන්ධයෙන් තවත් අදහස් ඉදිරිපත් කරනවාද. ගයාන් දුමින්ද මන්ත්‍රීතුමා අදහස් ඉදිරිපත් කරනවාද. නැතිනම් ඒ යෝජනාවත් ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**05 – (03) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමා විසින් යෝජනා කරයි.**

සීතාවක ප්‍රාදේශීය බල ප්‍රදේශයේ පවත්වාගෙන යන වැඩිහිටි නිවාස ඉමහත් සමාජ සේවාවක් සිදු වන ස්ථාන වේ. මෙම නිවාස තුල අසරණ දෙමාපියන් හා රෝගීන් ඉතාමත් හොඳින් රැක බලා ගනිමින් විශාල මුදලක් වැය කරනු ලබයි.

වැඩිහිටි නිවාස තුල මිය යන අයවලුන්ගේ මෘත දේහයන් ආදාහනය කිරිම සඳහා මුදල් යෙදවීමේදී මෙම පාලක පාලිකාවන් ඉමහත් අසරණ හා ගැටළු සහගත තත්වයකට පත් වේ. එහෙයින් සීතාවක ප්‍රාදේශීය සභාව සතු ආදාහනාගාර ඔවුන් හට නොමිලේ ලබා දීමට කටයුතු කරමු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

පිටපත් - සියළු වැඩිහිටි නිවාස වෙත යොමු කරන්න.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ මේරි මාග්‍රට් මැතිතුමිය.

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

මෙම යෝජනාව සම්බන්ධයෙන් පහත නම් සඳහන් ගරු මන්ත්‍රිවරුන් විසින් අදහස් දක්වන ලදී.

1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය.

2.ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා.

ගරු සභාපතිතුමා

ඒ අනුව මේ යෝජනාවත් අපේ මන්ත්‍රිවරු සියළුදෙනාගේම එකඟතාවය අනුව ඒකමතිකව සහා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගයාන් දුමින්ද මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ මේරි මාග්‍රට් මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**05 – (04) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ මේරි මාග්‍රට් මැතිතුමිය විසින් යෝජනා කරයි.**

කොළඹ දිස්ත්‍රික්කයේ නැගෙනහිර හේවාගම් කෝරළයේ සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංක 443/ඒ ග්‍රාම නිලධාරි වසමේ පහත්ගම, ඉහළ හංවැල්ල ඊරියගහදෙනියේ කුඹුර සහ වත්ත යන ඉඩමේ මීටර් 111 ක් දිග හා මීටර් 3 ක් පළල ඊරියගොල්ල මාර්ගයෙන් ආරම්භ වී වන්නමුවත්ත වඩුගේ ෆ්‍රැන්ක්ලෝස් ප්‍රනාන්දු මහතාගේ ඉඩමෙන් අවසන් වන මාර්ගය ප්‍රාදේශීය සභාවට පවරා ගත යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රිවරුන් අදහසක් ඉදිරිපත් කරනවාද. මේ යෝජනාවත් ඒකමතික සහා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ මේරි මාග්‍රට් මැතිතුමියගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**05 – (05) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමිය විසින් යෝජනා කරයි.**

සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් 439 දිද්දෙණිය උතුර ග්‍රාම සේවා වසමට අයත් දිද්දෙණිය ගම තිබෙන කම්මල්වත්ත අතුරු පාර (5 වන පටුමග) ටී.ඩී.ජේ. පෙරේරා මිනින්දෝරු මහතා විසින් 1996.07.07 දින අඳින ලද කම්මල්වත්ත ප්‍රධාන පාරෙන් පටන්ගෙන කම්මල්වත්ත ප්‍රධාන පාරෙන් අවසන් වන දිගින් 137.5 m හා පළලින් 3.0 m පාර සීතාවක ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කරනවාද. මේ යෝජනාවත් ඒකමතික සහා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමියගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**05 – (06)** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමිය විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 439/ඒ දිද්දෙණිය දකුණ ග්‍රාම සේවා වසමට අයත් දිද්දෙණිය ගම තිබෙන දිද්දෙණිය ප්‍රාර්ථනා උත්සව ශාලාව ඉදිරිපිට ඇති අතුරු පාර සේන ඉද්දමල්ගොඩ මහතා විසින් 3/2013 පිඹුරෙහි අඳින ලද කම්මල්වත්ත අතුරු පාර 06 වන පටුමග, කම්මල්වත්ත ප්‍රධාන පාරෙන් පටන්ගෙන සිරිල් සේනාධිර මහතාගේ පුද්ගලික ඉඩමෙන් අවසන් වන දිගින් 90 m හා පළලින් 5.79 m ක් වන අතුරු පාර සීතාවක ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කරනවාද. මේ යෝජනාවත් ඒකමතික සහා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමියගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අශෝක වැලිකල මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**05 – (07)** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමිය විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයට අයත් අංක 439/ඒ දිද්දෙණිය ද ග්‍රාම සේවා වසමට අයත් දිද්දෙණිය ගම තිබෙන හල්ගස්හේන ජනපදයෙහි අතුරු පාර ටී.කේ ද එස්. ජයරත්න මිනින්දෝරු මහතා විසින් 1982.04.27 දින අඳින ලද හල්ගස්හේන ජනපද ප්‍රධාන පාරෙන් පටන්ගෙන එච්.ඒ.ඩී. සුනිල් ශාන්ත මහතාගේ ඉඩමෙන් අවසන් වන දිගින් 76 m හා පළලින් 3 m ක් වන මාර්ගය සීතාවක ප්‍රාදේශීය සභාවට පවරාගෙන සංවර්ධනය කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රිවරුන් අදහස් ඉදිරිපත් කරනවාද. මේ යෝජනාවත් ඒකමතික සහා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමියගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**05 – (08)** ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

**2018.05.11** වන දින පැවති මහා සභාවේ තීරණ අංක **05 (06)** යටතේ මහා සභාවේ ආවරණ අනුමැතියට යටත්ව මා වෙත ගෙවීම් කිරිමට පවරන ලද බලය අනුව මා විසින් කරන ලද පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ගෙවීම් ඊට අනුරූපිව ඇති ගෙවීම් ලබන්නා වෙත ඊට ඉදිරියෙන් දක්වා ඇති මුදල ගෙවීම අනුමත කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අනු අංක | වවුචර් අංකය හා දිනය | විස්තරය | මුදල රු. |
|---|---|---|---|
| 01 | **535 -539**<br>**2019.03.08** | **2019** පෙබරවාරි මස ප්‍රධාන කාර්යාලයේ, පාදුක්ක උප කාර්යාලයේ, කොස්ගම උප කාර්යාලයේ, හංවැල්ල උප කාර්යාලයේ හා කහහේන උප කාර්යාලයේ මාර්ග, සෞඛ්‍ය, ආයුර්වේද, පුස්තකාල හා ව්‍යාපෘති අංශයන්හි සේවයේ නියුතු ආදේශක සේවකයින් **102** දෙනෙකු වෙනුවෙන් දෛනික වැටුප් ගෙවීම. | **2,424,102.32** |
| 02 | **722-726**<br>**2019.03.21** | **2019** මාර්තු මස ප්‍රධාන කාර්යාලයේ, පාදුක්ක උප කාර්යාලයේ, කොස්ගම උප කාර්යාලයේ, හංවැල්ල උප කාර්යාලයේ හා කහහේන උප කාර්යාලයේ සේවයේ නියුතු ස්ථිර විශ්‍රාම වැටුප් සහිත සේවකයින් **200** දෙනෙකු සඳහා වැටුප් ගෙවීම. | **7,178,340.22** |
| 03 | **608**<br>**2019.03.13** | **2019.02.03** වන දින සිට **2019.02.28** වන දින දක්වා සභාවේ වාහන සඳහා ණයට ලබා ගත් ඉන්ධන වලට අදාල බිල්පත් ගෙවීම. (එස්.ඒ.ඩී.සී. සමන්ත, ලංකා ඉන්ධන පිරවුම්හල, පරණ පාර, හංවැල්ල.) | **336,863.00** |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පිරීස් මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රිවරුන් අදහස් ඉදිරිපත් කරනවාද. මේ යෝජනාවත් ඒකමතික සහා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පිරීස් මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**05 – (09)** ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් පාදුක්ක සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි බල ප්‍රදේශය පුරා වර්ධනය වෙමින් පැවති ඩෙංගු උවදුර මර්ධනය කිරිමේ අරමුණින් ආරම්භ වූ "ඩෙංගු මර්දන ව්‍යාපෘතිය" මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඉදිරියටද ඩෙංගු රෝගය මර්දනය කිරිම සඳහා ඩෙංගු රෝගය මර්දන ව්‍යාපෘතියේ සේවකයින්ගේ සේවය අත්‍යවශ්‍ය බැවින්, **2019.05.01** දින සිට **2020.04.30** දින දක්වා වසරක කාල සීමාවක් සඳහා පාදුක්ක ඩෙංගු මර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාල සීමාව දිර්ඝ කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමිය

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රිවරුන් අදහස් ඉදිරිපත් කරනවාද. මේ යෝජනාවත් ඒකමතික සහා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගීතාමණී ස්වර්ණලතා මැතිතුමියගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**05 – (10)** ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයට අයත් හංවැල්ල සෞඛ්‍ය වෛද්‍ය නිලධාරි බල ප්‍රදේශය පුරා වර්ධනය වෙමින් පැවති ඩෙංගු උවදුර මර්ධනය කිරිමේ අරමුණින් ආරම්භ වූ "ඩෙංගු මර්දන ව්‍යාපෘතිය" මේ වන විට සාර්ථකව ක්‍රියාත්මක වෙමින් පවතින අතර ඉදිරියටද ඩෙංගු රෝගය මර්දනය කිරිම සඳහා ඩෙංගු මර්දන ව්‍යාපෘතියේ සේවකයින්ගේ සේවය අත්‍යවශ්‍ය බැවින් **2019.05.01** දින සිට **2020.04.30** දින දක්වා වසරක කාල සීමාවක් සඳහා හංවැල්ල ඩෙංගු මර්ධන ව්‍යාපෘතියේ ව්‍යාපෘති කාල සීමාව දිර්ඝ කිරිම සුදුසු බවට මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වන්දන මුදුන්කොටුව මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

ඒ සම්බන්ධයෙන් ගරු මන්ත්‍රිවරුන් අදහස් ඉදිරිපත් කරනවාද. මේ යෝජනාවත් ඒකමතික සහා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී වන්දන මුදුන්කොටුව මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

**05 – (11)** ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කළ යුතු පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ව්‍යාපෘති ඊට අනුරූපිව ඇති කොන්ත්‍රාත් සමිති/ ආයතන/ පුද්ගලයින් සමඟ ඊට ඉදිරියේ දක්වා ඇති ගිවිසුම් ගත මුදල අනුව ගිවිස ගනිමින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

| අ.අ | ව්‍යාපෘතිය | මුල්‍ය සම්පාදනය | කොන්ත්‍රාත් සමිතිය/ ආයතනය/ පුද්ගලයා | ගිවිසුම්ගත මුදල රු. |
|---|---|---|---|---|
| **01** | සීතාවක ප්‍රාදේශීය සභාවේ ක්‍රීඩක ක්‍රීඩිකාවන් බස්නාහිර පළාත් ක්‍රීඩා තරඟාවලියට සහභාගී කරවීම.<br>ප්‍රවාහන වියදම් රු. **30,000.00**<br>ප්‍රථමාධාර රු. **10,000.00** | සභා අරමුදල් | සරජ ප්‍රධාන කාර්යාලය. | **130,000.00** |

| | | | | |
|---|---|---|---|---|
| | ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා උදේ ආහාරය<br>දිවා ආහාරය හා තේ ලබා දීම<br>( දින 03 ක් සඳහා) රු.75,000.00<br>අවිනිශ්චිත වියදම් රු.15,000.00<br>රු.130,000.00 | | | |
| 02 | නිරිපොල ගල්කැටිය කන්ද පාර තාර දමා ප්‍රතිසංස්කරණය කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>නිරිපොල වැඩිහිටි සංවිධානය,<br>438, නිරිපොල. | 493,491.61 |
| 03 | කහහේන රජමල් උයන පාර තාර දමා සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති,<br>කහහේන සමඟි ගොවි සංවිධානය. | 304,460.59 |
| 04 | රන්දිය ඇල්ල පාර සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>443/බී, හංවැල්ල නගරය, ග්‍රාම සංවර්ධන සමිතිය. | 143,669.98 |
| 05 | මහායාය වත්ත පාර අවසන් කොටස සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>443/බී, හංවැල්ල නගරය, ග්‍රාම සංවර්ධන සමිතිය. | 105,577.68 |
| 06 | නම්බිගොඩ පාර සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>ස්වශක්ති ගොවි සංවිධානය,<br>අකරවිට. | 57,363.69 |
| 07 | කොස්ගම උප කාර්යාල ගොඩනැගිල්ලට කොටසක් එකතු කිරීම. (අතිරේක ඇස්තමේන්තුව) | සභා අරමුදල් | සභාපති,<br>කැළණි මිටියාවත,<br>427, පහළ කොස්ගම නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය. | 348,402.70 |
| 08 | කොස්ගම සතිපොළ වැසිකිළි වල සකස් කිරිම.<br>(අතිරේක ඇස්තමේන්තුව) | සභා අරමුදල් | සභාපති,<br>කැළණි මිටියාවත,<br>427, පහළ කොස්ගම නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය. | 114,338.04 |
| 09 | කහහේන පුස්තකාලය, පෙර පාසල හා මාතෘ සායනය සඳහා වෙනම ප්‍රවේශයක් වෙන්කිරිම. (11 අදියර) | සභා අරමුදල් | සභාපති,<br>කහහේන සමඟි ගොවි සංවිධානය. | 180,770.48 |
| 10 | රණවිරුගම ජල බැසයන කාණුව තැනීම. | සභා අරමුදල් | සභාපති,<br>ස්වර්ණ ජයන්ති රණවිරුගම සුභසාධක සමිතිය. | 266,165.40 |
| 11 | රණවිරුගම පාර මුල කොටස සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>ස්වර්ණ ජයන්ති රණවිරුගම සුභසාධක සමිතිය. | 270,884.50 |
| 12 | ඇස්වත්ත හත්දූව අතුරු මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>ඇස්වත්ත එක්සත් සුභසාධක සමිතිය. | 335,641.60 |

| | | | | |
|---|---|---|---|---|
| 13 | ඇස්වත්ත මිරිස්වත්ත පාරේ දොළ සල පැති බැම්ම තැනීම. | සභා අරමුදල් | සභාපති,<br>ඇස්වත්ත එක්සත් සුභසාධක සමිතිය. | 315,681.50 |
| 14 | වේරගොල්ල උඩමළුව පාරේ ජල බැසයන බෝක්කුව තැනීම. | සභා අරමුදල් | සභාපති,<br>බෝධිභාරකාර සමිතිය,<br>වේරගොල්ල උතුර. | 201,620.15 |
| 15 | වේරගොල්ල පළමු පටුමග ආරම්භක ස්ථානය ජල බැසයන කාණු තැනීම. | සභා අරමුදල් | සභාපති,<br>බෝධිභාරකාර සමිතිය. | 77,229.65 |
| 16 | පරණගම කහවකන්ද මාර්ගය කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>තාවල්ගොඩ ගොවි සංවිධානය. | 283,694.75 |
| 17 | ඇස්වත්ත ප්‍රගතිපුර බෝක්කුවේ පැති බැම්ම ඉදිකිරීම සහ දෙපස මාර්ගය සකස් කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>ඇස්වත්ත එක්සත් සුභසාධක සමිතිය. | 568,572.99 |
| 18 | බැරේගල ජම්බල ගහයට පාර කොන්ක්‍රීට් දමා සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>අළුත්අම්බලම ග්‍රාම සංවර්ධන සමිතිය 428 ඒ. | 254,363.70 |
| 19 | කොස්ගම දුම්රියපල පාර තාර දමා සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>කැළණි මිටියාවත, 427, පහළ කොස්ගම නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය | 149,325.01 |
| 20 | කොස්ගම නාගහවත්ත පාරේ කොටසක් සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>කැළණි මිටියාවත, 427, පහළ කොස්ගම නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය | 379,893.75 |
| 21 | හිඟුරල මහවල දෙනිය මාර්ගය සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>හිඟුරල රන්දිරි වැඩිහිටි සමිතිය,<br>හිඟුරල. | 417,402.51 |
| 22 | බොරළුගොඩ ඉලුක්මණ්ඩිය පාර සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>සුමිතුරු ගොවි සංවිධානය,<br>කළුඅග්ගල | 198,222.34 |
| 23 | බොල්ලතාව ගොනබරුව පාර තාර දමා සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>ජන ජය ග්‍රාම සංවර්ධන සමිතිය,<br>බොල්ලතාව. | 544,059.88 |
| 24 | සුදුවැල්ල ආදාහනාගාර භූමිය වටා තාප්පයක් ඉදිකිරීමට අත්තිවාරම් දැමීම හා කම්බි වැට තැනීම.<br>( 1 අදියර) | සභා අරමුදල් | සභාපති,<br>සුදුවැල්ල ප්‍රගති ගොවි සංවිධානය. | 1,065,374.72 |
| 25 | මැද්දගොඩැල්ල පාර තාර දමා සංවර්ධනය කිරීම. | සභා අරමුදල් | සභාපති,<br>කනම්පැල්ල බටහිර ඒකාබද්ධ ගොවි | 302,401.52 |

| | | | | |
|---|---|---|---|---|
| | | | සංවිධානය. | |
| 26 | සීතාවක ප්‍රාදේශීය සභාව යෝජිත රථගාල තැනීම. ( මෝටර් සයිකල් සඳහා ) අතිරේක ඇස්තමේන්තුව. | සභා අරමුදල් | සභාපති, 443/බී, හංවැල්ල නගරය ග්‍රාම සංවර්ධන සමිතිය. | 37,325.55 |
| 27 | සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තුන්නාන ගම්මැද්ද ප්‍රධාන මාර්ගය ( කොන්ක්‍රීට් දමා) සංවර්ධනය කිරිම. | පළාත් සංව සංවර්ධන | සභාපති, පොදුජන සේවා සුභසාධක සමිතිය, 444/බී, තුන්නාන බටහිර. | 434,716.34 |
| 28 | සීතාවක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ තුන්නාන ගම්මැද්ද ධම්මික මහතාගේ නිවස අසල ඇති පොදු මාර්ගය සංවර්ධනය කිරිම. | පළාත් සංවර්ධන | සභාපති, පොදුජන සේවා සුභසාධක සමිතිය, 444/බී, තුන්නාන බටහිර. | 434,634.13 |
| 29 | කහහේන උප කාර්යාලය අංශ වෙන්කිරිම. | සභා අරමුදල් | සභාපති, කහහේන සමඟි ගොවි සංවිධානය. | 279,938.20 |
| 30 | කහහේන බොරලුගොඩ පාසැල් මාවත තාර දමා සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති, කහහේන සමඟි ගොවි සංවිධානය. | 775,189.05 |
| 31 | බෝපේ පෙරෝලිස් මාවත කොන්ක්‍රීට් කිරිම. (2019.02.11 දින මහා සභාවේ 05 (15) -29 තීරණයේ මුදල රු. 361,937.50 සංශෝධනය කිරිම.) | සභා අරමුදල් | සභාපති, සියඹලාව ගොවි සංවිධානය, බෝපේ, පාදුක්ක. | 400,289.22 |
| 32 | සභාව සතු ZA – 5041 දරණ බැකෝ යන්ත්‍රයේ පැය 4000 න් කළ යුතු සේවා වාරය. | සභා අරමුදල් | ඇවන්ස්මාර්ට් ඉංජිනියරින් (pvt) Ltd, අංක 33, 15 බී මහල, පාර්ක්ලන්ඩ් ගොඩනැගිල්ල, පාර්ක් ස්ට්‍රීඩ්, කොළඹ 02. | 130,912.70 |
| 33 | මහජන සෞඛ්‍ය පරික්ෂක කේ.ඒ.එල්. රාජපක්ෂ මහතාගේ ඉල්ලීම අනුව, හංවැල්ල මහජන සෞඛ්‍ය පරික්ෂක කොට්ඨාසයේ ආහාර පරිහරණය කරනු ලබන ආයතන වල පුද්ගලයින් දැනුවත් කිරිම.<br>ලිපි 500 ක් ඩුප්ලෝ කිරිම රු.2000.00<br>සහභාගි වන 150 දෙනෙක් සඳහා සංග්‍රහ රු. 9750.00<br>( කිරි පැකට් හා බනිස්)<br>රු.11,750.00 | සභා අරමුදල් | සරප්, ප්‍රධාන කාර්යාලය. | 11,750.00 |
| 34 | සභාව සතු 252 – 6388 දරණ කැබ් රථයේ අළුත්වැඩියා කටයුතු සිදු කිරිම. | සභා අරමුදල් | සෙන්ට්‍රල් මෝටර්ස්, 58/5, හංවැල්ල පාර, පාදුක්ක. | 250,500.00 |
| 35 | නෙළුවත්තුඩුව පල්ලිය පාර අතුරු පාර සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති, වැඩිහිටි සංවිධානය, නෙළුවත්තුඩුව, වග. | 636,062.79 |
| 36 | අරුක්වත්ත ජයසුන්දර පෙදෙස අජිත් මහතාගේ කඩය අසල සිට ප්‍රධාන මාර්ගය තාර දැමීම. | සභා අරමුදල් | සභාපති, මොරගහතැන්න | 394,777.50 |

| | | | | |
|---|---|---|---|---|
| | | | ප්‍රජාමූල සංවිධානය, 460/ඒ, අරුක්වත්ත දකුණ. | |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුසන්ත මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා

ගරු සභාපතිතුමනි, මෙහි අංක 27 හා 28 යෝජනා දෙක මා විසින් ඉවත් කරගන්නවා. ඔබතුමාට ඒ සම්බන්ධයෙන් ලිපියක් ලබලා දීලා තියෙනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමනි, මේ යෝජනාවේ අංක 24 සුදුවැල්ල ආදාහනාගාර භූමිය වටා තාප්පයක් ඉදිකිරිම, අත්තිවාරම් දැමීම හා කම්බි වැට තැනීම මෙම ව්‍යාපෘතිය සඳහා කොන්ත්‍රාත් සමිතිය හැටියට සුදුවැල්ල ප්‍රගති ගොවි සංවිධානය යෝජනා කරලා තියෙනවා. හැබැයි මම දන්න විදිහට මේ සමිතිය තාම ක්‍රියාත්මක නැහැ. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්න ඕන.

ගරු සභාපතිතුමා

ගරු මන්ත්‍රිතුමා, මේ පිළිබඳව පැහැදිලි කිරිමක් අවශ්‍ය වෙනවා. කාරක සභාවක් බවට පත් කරලා අපි මේ ගැන කරුණු දැනගෙන අපි ආපහු මහා සභාවට සංශෝධන යෝජනාවක් විදිහට අරගෙන එමු.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමනි, මෙම මහා සභාව කාරක සභාවක් බවට පත් කළ යුතු යැයි යෝජනා කරනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

අපි කාරක සභාවේදී ගත්ත තීරණය අනුව විමල් ප්‍රසන්න මන්ත්‍රිතුමා ඉදිරිපත් කල අංක 27 හා 28 ත් උපුල් මනෝජ් රූපසිංහ මන්ත්‍රිතුමා විසින් සංශෝධනය කල අංක 24 ත් යන ඒ ව්‍යාපෘති 03 අයින් කරලා ඉතිරි ව්‍යාපෘති යෝජනාවන් තමයි මේකට ඇතුළත් වෙන්නේ කියන බවට මේ සංශෝධනය පිළි ගන්නවා. කාරක සභාවේ කථා කරගත් විදිහට ඒ සංශෝධන තුන පිළිගෙන එය ඉවත් කරලා මේ යෝජනාව සම්මත කරන්න තමයි යෝජනාවක් විදිහට ඉදිරිපත් කරන්නේ.

මෙම යෝජනාව සම්බන්ධයෙන් පහත නම් සඳහන් ගරු මන්ත්‍රිතුමා විසින් අදහස් දක්වන ලදී.

**1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සුරියආරච්චි මැතිතුමා**

**<u>ගරු සභාපතිතුමා</u>**

**මේ යෝජනාව සම්බන්ධයෙන් තවත් අදහස් ගරු මන්ත්‍රීවරුන් ඉදිරිපත් කරනවාද. මේ යෝජනාවත් අදාල සංශෝධනයන්ට යටත්ව ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.**

**<u>ඉහත යෝජනාවෙන් අංක 24, 27 හා 28 යන ව්‍යාපෘතින් ඉවත් කර එම සංශෝධනයන්ට යටත්ව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ.සුසන්ත මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

**<u>05 – (12) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

**සීතාවක ප්‍රාදේශීය සභාවේ අභ්‍යන්තර විගණන කාර්යභාරය විධිමත් කිරිම සඳහා 2019 වර්ෂය වෙනුවෙන් සකස් කරන ලද මේ සමඟ අමුණා ඇති අභ්‍යන්තර විගණන සැලැස්ම පිළි ගත යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා</u>**

**ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.**

**මෙම යෝජනාව සම්බන්ධයෙන් පහත නම් සඳහන් ගරු මන්ත්‍රීතුමා විසින් අදහස් දක්වන ලදී.**

**1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.**

**<u>ගරු සභාපතිතුමා</u>**

**ඒ සම්බන්ධව තවත් ගරු මන්ත්‍රීවරුන් අදහස් ඉදිරිපත් කරනවාද. මේ යෝජනාවත් ඒකමතිකව සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.**

**<u>ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.</u>**

**<u>ගරු සභාපතිතුමා</u>**

**මීළගට තේ විවේකය සඳහා හා ටෙන්ඩර් මණ්ඩල රැස්වීම සඳහා සභාවේ වැඩ කටයුතු විනාඩි 30 කට අත්හිටුවනවා.**

**මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව. 10.55 ට අත්හිටුවන ලදී.**

**නැවතත් මහ සභාවේ වැඩ කටයුතු පෙ.ව. 11.25 ට ආරම්භ කරන ලදී.**

**<u>ගරු සභාපතිතුමා</u>**

**අපි නැවතත් සභාවේ වැඩ කටයුතු ආරම්භ කරනවා. 05 – (13) යෝජනාව ඉදිරිපත් කිරිම සඳහා සමන්ත උදයකුමාර මන්ත්‍රීතුමාට අවස්ථාව ලබලා දෙනවා.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා</u>**

**ගරු සභාපතිතුමනි, මේ යෝජනාව ඉදිරිපත් කිරිමට පෙර අතුව මම මේ මහා සභාව කාරක සභාවක් බවට යෝජනා කරනවා.**

**<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා</u>**

**ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.**

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා

ගරු සභාපතිතුමනි, මෙම කාරක සභා අවස්ථාව මහා සභාවක් බවට පත් කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

සමන්ත උදයකුමාර මන්ත්‍රීතුමා යෝජනාව ඉදිරිපත් කරන්න.

05 – (13) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා විසින් යෝජනා කරයි.

පූගොඩ, කනම්පැල්ල, මාර්ගයේ 7/2 දරණ බෝක්කුව ඔස්සේ සහ කනම්පැල්ල ශ්‍රී සුමනාරාම විහාරස්ථාන මාර්ගය ඔස්සේ ද, ඊට ආසන්න ඉඩම් තුළින් ස්වාභාවිකව ගලා බසින වර්ෂා ජලය කොස්ගම, කනම්පැල්ල, නො.108 හි පදිංචි ජී.කේ. සෝමසිරි චන්ද්‍රසේන මහතාට අයත් ඉඩම හරහා බාධාවකින් තොරව ස්වාභාවිකව ගමන් කිරීමට හැකි වන පරිදි එම ඉඩමේ හා ඊට යාබද ඉඩම් තුළින් ස්වාභාවිකව ජල බැස්ම ගලා බැසීමට හැකිවන පරිදි මායිම් විවෘතව තැබීමට කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමා

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

මෙම යෝජනාව සම්බන්ධයෙන් පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් විසින් අදහස් දක්වන ලදී.

1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා.

2.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල විරරත්න මැතිතුමා.

3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා.

4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා.

5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ජී.ඩී. ඉන්ද්‍රානි සෙනෙහෙලතා පද්මසීලි මැතිතුමිය.

6.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.උපුල් ප්‍රසන්න මැතිතුමා.

7.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය.

8.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා.

9.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂිණි ශ්‍රිමාලි හෙට්ටිආරච්චි මැතිතුමිය.

10.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා.

11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා.

12.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා.

13.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා.

14.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා.

15.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සනී හෙක්ටර් පීරිස් මැතිතුමා.

**16.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ ප්‍රේමරත්න මැතිතුමා.**

**17.ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා.**

**ඉහත යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් පැවති බැවින් ඡන්ද විමසීමක් සිදු කරන ලදී.**

01. ගරු සභාපති ජී.ජයන්ත රෝහණ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
02. ගරු උප සභාපති එස්.ඩී.මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
04. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ඒ. විමල් ප්‍රසන්න මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
05. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඒ.මේරි මාග්‍රට් මැතිතුමිය යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
06. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර් .ගයාන් දූමින්ද මැතිතුමා ඒ අවස්ථාවේ සභා ගර්භයේ නොසිටින ලදී.
07. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
09. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ. මංජුල වීරරත්න මැතිතුමා යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
10. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ඒ .ප්‍රේමරත්න මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
11. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
12. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී .සනී හෙක්ටර් පීරිස් මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
13. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී .කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
14. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. නන්ද කුමාරසිංහ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
15. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
16. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
17. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ජිනේන්ද්‍ර මැතිතුමා යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
18. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
19. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ඒ.ඩී .ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
20. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය ඒ අවස්ථාවේ සභා ගර්භයේ නොසිටින ලදී.
21. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ .සුසන්ත මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
22. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
23. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච් .වරුණ දිලිප් කුමාර මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
24. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.උපුල් ප්‍රසන්න මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
25. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
26. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. නිමල් යසසිරි කළුපහන මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
27. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
28. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
29. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ් .අසෝක වැලිකල මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
30. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මැතිතුමා යෝජනාවට ඡන්දය ප්‍රකාශ කිරීමෙන් වැළකී සිටින ලදී.
31. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කුමුදිණී ජයවර්ධන මැතිතුමිය යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
32. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂිණී ශ්‍රිමාලි හෙට්ටිආරච්චි මැතිතුමිය යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
33. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඊ.ජී.ඩී.ඉන්ද්‍රානි පද්මසීලි මැතිතුමිය යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
34. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී .මාලනී චන්ද්‍රලතා මැතිතුමිය යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
35. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය ඒ අවස්ථාවේ සභා ගර්භයේ නොසිටින ලදී.
36. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
37. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් .චන්දන සූරියආරච්චි මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
38. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්. සුනිල් රණසිංහ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
39. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
40. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ.ප්‍රදිප් කුමාර් මැතිතුමා ඒ අවස්ථාවේ සභා ගර්භයේ නොසිටින ලදී.

| | |
|---|---|
| යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දුන් ගරු මන්ත්‍රීවරු | **26** |
| යෝජනාවට වික්ෂව ඡන්දය ලබා දුන් ගරු මන්ත්‍රීවරු | **09** |
| යෝජනාවට ඡන්දය ලබා දීමෙන් වැළකී සිටි ගරු මන්ත්‍රීවරු | **01** |
| ඡන්දය විමසන අවස්ථාවේදී සභා ගර්භයේ නොසිටි ගරු මන්ත්‍රීවරු | **04** |

<u>ගරු සභාපතිතුමා</u>

ඒ අනුව මෙම යෝජනාව බහුතර ඡන්දයෙන් සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.

<u>**ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදයකුමාර ගමගේ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී නන්ද කුමාරසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් බහුතර ඡන්ද 17 කින් සභා සම්මත විය.**</u>

<u>**05 – (14) ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමා විසින් යෝජනා කරයි.**</u>

දැනට පවතින ත්‍රස්තවාදය වැලැක්වීමේ පනත අහෝසි කර ඒ වෙනුවට ප්‍රතිත්‍රස්ත පනත නීතිගත කිරීමට වත්මන් ආණ්ඩුව ක්‍රියා කරමින් පවතී. යෝජිත පනත 2018.09.14 ගැසට් මගින් ප්‍රසිද්ධියට පත් කර ඇත.

මිනිසුන්ගේ නිදහස, රැස්වීමේ නිදහස, අදහස් පල කිරීමේ නිදහස ඇතුළු සමාජ හා මානව ප්‍රජාතන්ත්‍රවාදයට හානිකර වූ කරුණු රැසක් අදාල පනතේ සඳහන් වන අතර ඕනෑම ක්‍රියාවක් ත්‍රස්ත ක්‍රියාවක් සේ අර්ථකථනය කිරීමේ හැකියාවක් පොලිස් කොස්තාපල්වරයෙකුට වෙරළාරක්ෂක නිලධාරියෙකුට පවා ඉඩ ලබා දී ඇති පනතකි.

අප සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශයේ ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු සියළු ජන කොටස් වල නිදහස, අයිතිය සුරක්ෂිත කිරීමේ අයිතියක් මහජන නියෝජිතයින් වන අප කා සතුවත් ඇත.

එම නිසා යෝජිත පනතේ ඇති හානිදායක තත්වයන් ඉවත් කර එවැනි පනතක් සමාජයේ ජීවත් වන සැමගේ මූලික අයිතින් උල්ලංඝනය කිරීමක් සිදු වන බවට විරෝධය පල කිරීමේ මහා සභා යෝජනාවක් සභා සම්මත කර ගරු ජනාධිපතිතුමා, ගරු අගමැතිතුමා, ගරු විපක්ෂ නායකතුමා, ආරක්ෂක ලේකම්, නීතිපති, ගරු කථානායකතුමා ඇතුළු අය වෙත යොමු කරන මෙන් යෝජනා කර සිටිමි.

<u>ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුනිල් රණසිංහ මැතිතුමා</u>

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

මෙම යෝජනාව සම්බන්ධයෙන් පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් විසින් අදහස් දක්වන ලදී.

1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා.

2.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.

3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා.

4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදයකුමාර ගමගේ මැතිතුමා.

5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ. ප්‍රදීප් කුමාර් මැතිතුමා.

6. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මැතිතුමා.

7. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ජිනේන්ද්‍ර කුලතිලක මැතිතුමා.

8.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා.

9. ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා

<u>ඉහත යෝජනාව සම්බන්ධයෙන් බෙදීමක් පැවති බැවින් ඡන්ද විමසීමක් සිදු කරන ලදී.</u>

01. ගරු සභාපති ජී.ජයන්ත රෝහණ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
02. ගරු උප සභාපති එස්.ඩී.මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
03. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන මුදුන්කොටුව මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

**04.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ.ජී. විමල් ප්‍රසන්න මැතිතුමා ඒ අවස්ථාවේ සභා ගර්භයේ නොසිටින ලදී.
**05.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ජී.මේරි මාග්‍රට් මැතිතුමිය යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**06.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ආර් .ගයාන් දුමින්ද මැතිතුමා ඒ අවස්ථාවේ සභා ගර්භයේ නොසිටින ලදී.
**07.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්දන කුමාර මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**08.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**09.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී. මංජුල වීරරත්න මැතිතුමා යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**10.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්.ජී .ප්‍රේමරත්න මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**11.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදය කුමාර ගමගේ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**12.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී බී .සනී හෙක්ටර් පීරිස් මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**13.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී .කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**14.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එල්. නන්ද කුමාරසිංහ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**15.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් මනෝජ් රූපසිංහ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**16.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**17.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී උපුල් ජිනේන්ද්‍ර මැතිතුමා යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**18.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුසන්ත රූපසිංහ මැතිතුමා ඒ අවස්ථාවේ සභා ගර්භයේ නොසිටින ලදී.
**19.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ්.ජී.ඩී .ගීතාමනි ස්වර්ණලතා මැතිතුමිය යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**20.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී දනුෂ්කි ප්‍රභානි අල්මේදා මැතිතුමිය ඒ අවස්ථාවේ සභා ගර්භයේ නොසිටින ලදී.
**21.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඒ .සුසන්ත මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**22.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී. සමන්ත කුමාර මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**23.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච් .වරුණ දිලිප් කුමාර මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**24.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.පී.උපුල් ප්‍රසන්න මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**25.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චින්තක දේවින්ද සමරවීර මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**26.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කේ. නිමල් යසසිරි කළුපහන මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**27.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ගමගේ චන්ද්‍රසිරි මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**28.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අයෝම මධු ප්‍රසාද් දේවගේ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**29.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩබ් .අසෝක වැලිකල මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**30.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස්. චන්ද්‍රකුමාර් මැතිතුමා යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**31.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජී.කුමුදිණී ජයවර්ධන මැතිතුමිය යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**32.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂිණි ශ්‍රිමාලි හෙට්ටිආරච්චි මැතිතුමිය යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**33.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ටී.ජී.ඩී.ඉන්ද්‍රානි පද්මසීලි මැතිතුමිය යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**34.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එම්.ඩී .මාලනී චන්ද්‍රලතා මැතිතුමිය යෝජනාවට විපක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**35.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සාගරිකා කුමාරි රූපසිංහ මැතිතුමිය ඒ අවස්ථාවේ සභා ගර්භයේ නොසිටින ලදී.
**36.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඥාණ ප්‍රකාසම් ෆැන්සිස් මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**37.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එස් .චන්දන සූරියආරච්චි මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**38.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී එච්.එස්. සුනිල් රණසිංහ මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**39.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ති චන්ද්‍රිකා දමයන්ති මැතිතුමිය යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.
**40.** ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ජී.ප්‍රදිප් කුමාර් මැතිතුමා යෝජනාවට පක්ෂව ඡන්දය ප්‍රකාශ කරන ලදී.

| | |
|---|---|
| යෝජනාවට පක්ෂව ඡන්දය ලබා දුන් ගරු මන්ත්‍රීවරු | **26** |
| යෝජනාවට වික්ෂව ඡන්දය ලබා දුන් ගරු මන්ත්‍රීවරු | **09** |
| ඡන්දය විමසන අවස්ථාවේදි සභා ගර්භයේ නොසිටි ගරු මන්ත්‍රීවරු | **05** |

<u>ගරු සභාපතිතුමා</u>

**ඒ අනුව මෙම යෝජනාව බහුතර ඡන්දයෙන් සභා සම්මත වූ යෝජනාවක් විදිහට සලකනවා.**

<u>ඉහත යෝජනාව ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සූරියආරච්චි මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සුනිල් රණසිංහ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් බහුතර ඡන්ද 17 කින් සභා සම්මත විය.</u>

**<u>05 – (15) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.</u>**

**සීතාවක ප්‍රාදේශීය සභා බල ප්‍රදේශය තුල ක්‍රියාත්මක කළ යුතු පහත උප ලේඛනයේ විස්තර කරන්නට යෙදී ඇති ව්‍යාපෘති ඊට අනුරූපිව ඇති කොන්ත්‍රාත් සමිති/ ආයතන/ පුද්ගලයින් සමඟ ඊට ඉදිරියේ දක්වා ඇති ගිවිසුම් ගත මුදල අනුව ගිවිස ගනිමින් ගිවිසුම් ප්‍රකාරව කටයුතු කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.**

| අ.අ | ව්‍යාපෘතිය | මූල්‍ය සම්පාදනය | කොන්ත්‍රාත් සමිතිය/ ආයතනය/ පුද්ගලයා | ගිවිසුම්ගත මුදල රු. |
|---|---|---|---|---|
| 01 | අරුක්වත්ත ජයසුන්දර පෙදෙස අජිත් මහතාගේ කඩය අසල සිට ප්‍රධාන මාර්ගය තාර දැමීම. | සභා අරමුදල් | සභාපති, මොරගහතැන්න ප්‍රජාමූල සංවිධානය. | 394,777.50 |
| 02 | කෙහෙල්හේන්කන්ද පාර සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති, දිද්දෙණිය උතුර ගොවි සංවිධානය. | 221,850.39 |
| 03 | සේනානායක පෙදෙස 3 පටුමග ඉතිරි කොටස කොන්ක්‍රිට් කිරිම. | සභා අරමුදල් | සභාපති, 461, පාදුක්ක ග්‍රාම සංවර්ධන සමිතිය. | 121,265.11 |
| 04 | කහටපිටිය මුත්තන්වත්ත පාර ඉතිරි කොටස තාර දමා සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති, කහටපිටිය ගිරාඉඹුල එක්සත් ග්‍රාම සංවර්ධන සමිතිය. | 171,914.46 |
| 05 | ක්‍රිඩාංගන මාවත අතුරු මාර්ගය ස්ථාන දෙකක් තාර දැමීම. | සභා අරමුදල් | සභාපති, පහළ පාදුක්ක ග්‍රාම සංවර්ධන සමිතිය 461/සී. | 286,560.90 |
| 06 | බෙලිඅත්තවිල අරලිය මාවත කොටසක් තාර දමා සංවර්ධනය කිරිම. | සභා අරමුදල් | සභාපති, උඩුමුල්ල පැරකුම් ගොවි සංවිධානය. | 318,046.44 |
| 07 | කොස්ගම සතිපොළ රෙදිකඩ තැනීම. ( අතිරේක ඇස්තමේන්තුව) | සභා අරමුදල් | සභාපති, කැළණි මිටියාවත 427 පහළ කොස්ගම නැගෙනහිර ග්‍රාම සංවර්ධන සමිතිය. | 182,164.90 |
| 08 | සකුණ පියස ප්‍රජා ශාලාවේ ඇතුලත බිත්ති තීන්ත ආලේපය. | සභා අරමුදල් | සභාපති, තාවල්ගොඩ ගොවි සංවිධානය, මැද තාවල්ගොඩ, කොස්ගම. | 61,070.49 |
| 09 | අකරවිට විමලතිස්ස මදුආරච්චි මාවත පාර ලෙවන්ගම මහතාගේ නිවස අසල පැති බැම්ම. | සභා අරමුදල් | සභාපති, සමාධි වැඩිහිටි සංවිධානය, අකරවිට. | 516,959.55 |
| 10 | මාහිංගල ප්‍රජා ශාලාව ඉතිරි වැඩ නිම කිරිම. | සභා අරමුදල් | සභාපති, මාහිංගල ගොවි සංවිධානය. | 457,350.98 |
| 11 | පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ අංගම්පිටිය බෝගහ හන්දිය අතුරු මාර්ගය සංවර්ධනය කිරිම. | පළාත් සංවර්ධන | සභාපති, සෙත්සිරි සෙවණ වැඩිහිටි සංවිධානය, හල්පෙ | 249,845.12 |
| 12 | පාදුක්ක ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ හල්පේ ප්‍රේමදාස මහතාගේ නිවස අසල පොදු මාර්ගය සංවර්ධනය කිරිම. | පළාත් සංවර්ධන | සභාපති, සෙත්සිරි සෙවණ වැඩිහිටි සංවිධානය, හල්පෙ | 249,971.33 |

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදයකුමාර ගමගේ මැතිතුමා.

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

ගරු සභාපතිතුමා

ඒ අනුව මෙම යෝජනාව ඒකමතිකව සහා සම්මත වු යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදයකුමාර ගමගේ මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සහා සම්මත විය.

05 – (16) ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමා විසින් යෝජනා කරයි.

බස්නාහිර පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව මඟින් වාර්ෂිකව සංවිධානය කරන ලද පළාත් පාලන තරඟාවලියේ 2019 වර්ෂයේ පවත්වන ලද දිස්ත්‍රික් තරඟ සඳහා සහභාගි වී සීතාවක ප්‍රාදේශීය සභාව ලබා ගන්නා ලද අතිවිශිෂ්ට ජයග්‍රහණයද, පළාත් තරඟාවලියේදී ලබා ගත් ජයග්‍රහණ සඳහා දායක වු සියළුම ක්‍රීඩක ක්‍රීඩිකාවන් සඳහා සුභ පැතුම් හා ප්‍රශංසාව පිරිනැමීටත්, පළාත් තරඟාවලියේදී බස්නාහිර පළාත්, පළාත් පාලන දෙපාර්තමේන්තුව වරින් වර ලකුණු සංශෝධනය කර ප්‍රකාශයට පත් කරමින් සීතාවක ප්‍රාදේශීය සභාව ලබා ගත් ජයග්‍රහණය අහිමි කිරිම සම්බන්ධයෙන් සීතාවක ප්‍රාදේශීය සභාවේ දැඩි අප්‍රසාදය පළාත් පාලන දෙපාර්තමේන්තුව වෙත පල කළ යුතු යැයි මම මෙම ගරු සභාවට යෝජනා කරමි.

ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා.

ගරු සභාපතිතුමනි, එම යෝජනාව මා විසින් ස්ථිර කරනු ලබනවා.

මෙම යෝජනාව සම්බන්ධයෙන් පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන් විසින් අදහස් දක්වන ලදී.

1.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී මංජුල වීරරත්න මැතිතුමා.

2.ගරු උප සභාපති මංජුල ප්‍රදීප් කුමාර් මැතිතුමා.

3.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ලියනගේ චන්ද්‍රන කුමාර මැතිතුමා.

4.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී චන්දන සුරියආරච්චි මැතිතුමා.

5.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ජයන්ත රණවක මැතිතුමා.

6.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී සමන්ත උදයකුමාර ගමගේ මැතිතුමා.

7.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කුමුදිනී ජයවර්ධන මැතිතුමිය.

8.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී විමල් ප්‍රසන්න මැතිතුමා.

9.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ශෂිණී ශ්‍රීමාලි හෙට්ටිආරච්චි මැතිතුමිය.

10.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී පී.ඒ ප්‍රදීප් කුමාර් මැතිතුමා.

11.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඩී. ප්‍රියන්ත අරුණ කුමාර් ගුණරත්න මැතිතුමා.

12.ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමා.

ගරු සභාපතිතුමා

ඒ අනුව මෙම යෝජනාවත් ඒකමතිකව සහා සම්මත වු යෝජනාවක් විදිහට සලකනවා.

ඉහත යෝජනාව ගරු සභාපති ජී. ජයන්ත රෝහණ මැතිතුමාගේ යෝජනාවෙන් හා ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී කෝකිල සම්පත් වර්ණසිරි මැතිතුමාගේ ස්ථිරත්වයෙන් ඒකමතිකව සභා සම්මත විය.

**06.කාරක සභා වාර්තා.**

**06 – (01 ) 2019.03.21 නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභා රැස්වීමේ වාර්තාව.**

2019.03.21 වන දින පවත්වන ලද නිවාස හා ප්‍රජා සංවර්ධන කාරක සභාවේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.

**06 – (02 ) 2019.03.22 කාර්මික සේවා කාරක සභා රැස්වීමේ වාර්තාව.**

2019.03.22 වන දින පවත්වන ලද කාර්මික සේවා කාරක සභාවේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.

**06 – (03 ) 2019.03.26 පරිසර හා පහසුකම් කාරක සභා රැස්වීමේ වාර්තාව.**

2019.03.26 වන දින පවත්වන ලද පරිසර හා පහසුකම් කාරක සභාවේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.

**06 - (04) 2019.03.28 මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභා රැස්වීමේ වාර්තාව.**

2019.03.28 වන දින පවත්වන ලද මුදල් හා ප්‍රතිපත්ති සැකසීමේ කාරක සභාවේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.

**06 - (05) 2019.03.11 ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.**

2019.03.11 වන දින පවත්වන ලද ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.

**06 - (06) 2019.03.28 ටෙන්ඩර් මණ්ඩල රැස්වීමේ වාර්තාව.**

2019.03.28 වන දින පවත්වන ලද ටෙන්ඩර් මණ්ඩලයේ නිර්දේශ වාර්තාව මහ සභාව විසින් සලකා බලන ලදී.

**07.ලැබීම් හා වියදම් පිළිබඳ මාසික ප්‍රකාශ.**

**07 – (01) 2019 පෙබරවාරි මාසය ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය.**

2019 පෙබරවාරි මස ලැබීම් හා වියදම් පිළිබඳ ප්‍රකාශය මහා සභාව විසින් සලකා බලන ලදී.

**08. ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරුන්ගේ පෞද්ගලික ප්‍රකාශ. - ඉදිරිපත්ව නැත.**

ගරු සභාපතිතුමා

අද දින මහා සභා රැස්වීමට සහභාගි නොවූ ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ආර්.පී. යසරු දෙවන්මිණ රාජපක්ෂ මැතිතුමා, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී ඔල්ගා අතුකෝරල මැතිතුමිය, ගරු ප්‍රාදේශීය සභා මන්ත්‍රී අමල් පුස්සැල්ලගේ මැතිතුමා සඳහා නිවාඩු අනුමත කරනවා.

එසේ නම් අද දින මහා සභාවේ වැඩ කටයුතු අපි අවසන් කරන්න බලාපොරොත්තු වෙන්නේ. අපි නැවත හමුවෙන්නේ අළුත් අවුරුද්දක. ලබන්නා වූ සිංහල හා හින්දු අළුත් අවුරුද්ද 2019 සියළුදෙනාටම වාසනාවන්ත සුභ අළුත් අවුරුද්දක් වේවා කියලා ප්‍රාර්ථනය කරමින් උප සභාපතිතුමා ඇතුළු සියළු මන්ත්‍රිවරුන්ටත් ලේකම්තුමා ප්‍රධාන කාර්යමණ්ඩලයේ හැමදෙනාටමත් අපේ ප්‍රාදේශීය සභාවේ අනෙකුත් සියළු ආයතන වල සියළු නිලධාරින්ට සියළු සේවක සේවිකාවන් හැමදෙනාටම වාසනාවන්ත සුභම සුභ අළුත් අවුරුද්දක් වේවා යැයි ප්‍රාර්ථනා කරනවා.

ඒ වගේම මම තව කාරණයක් මතක් කරනවා. අපේ සභාව ගත්ත සම්ප්‍රදායක් දූරකථන භාවිතය ගැන තියෙනවා. අළුත් අවුරුද්දේ ඉඳන්වත් වෙනස් කරන්න හැමෝම කථා කරනවා. මට පේනවා. ඒ නිසා ඒ සම්ප්‍රදාය ආරක්ෂා කරන්න. මම ඉල්ලා සිටිනවා මේ හොඳම ආදර්ශය දුන්නේ ප්‍රදිප් තලේරත්න මන්ත්‍රිතුමා කියලා. දූරකථනයෙන් කථා කළේ නැහැ එතුමා එළියට ගියා. ඒ ආදර්ශය අරගන්න. එතුමා කොච්චර අවධානමක් තිබුණත් එතුමා දූරකතනය අරගෙන එළියට ගිහිල්ලායි කථා කළේ. එතුමා අනුගමනය කරන්න. කථා කරනවා නම් සභාවෙන් එළියට ගිහින් කථා කරන්න. හැමෝම සභාවේ දූරකථන භාවිතා කරනවා මට පේනවා. ලබන සභා වාරයේ ඉඳන් එසේ නොවේවා කියලා ප්‍රාර්ථන කරනවා.

අද දින සභාවට සහභාගී වුණු ගරු උප සභාපතිතුමා ඇතුළු ගරු මන්ත්‍රීතුමන්ලාටත් ස්තුතියත් ගෞරවයත් මේ අවස්ථාවේ පුද කරනවා. ඒ වගේම ලේකම්තුමා ඇතුළු කාර්ය මණ්ඩලයටත්, ජනමාධ්‍ය මහත්වරුන්ටත් සියළුදෙනාටම අපේ ගෞරවයත් ස්තුතියත් පුදකරනවා. සහභාගි වූ සියළුදෙනාටම ස්තුතිය පුද කරමින් අද දින සභාවේ වැඩ කටයුතු අවසන් කරනවා. බොහොම ස්තුතියි.

සභාවේ වැඩ කටයුතු ප.ව. 3.50 ට නිමාවට පත්විය.

කේ.ඒ. චන්දන පද්මසිරි,

ලේකම්,

සීතාවක ප්‍රාදේශීය සභාව,

හංවැල්ල.

2019.04.10 වන දින

සීතාවක ප්‍රාදේශීය සභාව,

හංවැල්ල.